*Asmt_PIT_003_S*

ශ්‍රී ලංකා දේශීය ආදායම්
இலங்கை உள்நாட்டு இறைவரி
Sri Lanka Inland Revenue

# හවුල් ව්‍යාපාර
# ආදායම් වාර්තාව සහ උපලේඛන
# සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් මාලාව

## තක්සේරු වර්ෂය
## 2023/2024

මෙම උපදෙස් මාලාව;

**අ**. පොදු උපදෙස්,
**ආ.** හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව සහ උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් වලින් සමන්විතය.

වාර්තාව සහ උපලේඛන සම්පූර්ණ කිරීමට පෙර මෙම උපදෙස් මාලාව පරිශීලනය කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. දේශීය ආදායම් වෙබ් ද්වාරය -www.ird.gov.lk වෙත පිවිසීමෙන් උපලේඛන හා උපදෙස් මාලාව බාගත කර ගැනීමට හැකිය.

## අ. පොදු උපදෙස්

**1.** දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලව හවුල් ව්‍යාපාරයක් විසින් ආයෝජන වත්කම් උපලබ්ධි වීම මගින් වන ලාභ ද ඇතුළත්ව තම හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායම මත ආදායම් බදු ගෙවීම සිදු කළ යුතුය.

### 2. වාර්තා නිකුත් කිරීම හා භාරදීම

#### නිකුත් කිරීම

2023/2024 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් සියළුම ලියාපදිංචි හවුල් ව්‍යාපාර වෙත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව නිකුත් කරනු ලැබේ.

#### භාරදීම

2023 අංක 04 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතෙන් සංශෝධිත දේශීය ආදායම් පනතේ 113 (1ආ) වගන්තිය ප්‍රකාරව 2023 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන තක්සේරු වර්ෂයේ සිට බදු වාර්තා ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ගොනු කිරීම **(**සෑම හවුල් ව්‍යාපාර බදුගෙවන්නෙකුටම අනිවාර්ය වේ.)

නිසි පරිදි සම්පූර්ණ කළ වාර්තාව, (වාර්තාව - හවුල් ව්‍යාපාර සහ අනිවාර්යය උපලේඛන) සහ වෙනත් අවශ්‍ය කරන ලිපිලේඛන, **2024 නොවැම්බර් 30** වන දින හෝ එදිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය ඔස්සේ භාරදීම සිදු කළ යුතුය.

### 3. බද්ද ගණනය කිරීම

හවුල් ව්‍යාපාරයක බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු ආදායම් බද්ද (ආයෝජන වත්කම් උපලබ්ධි වීම මගින් වන යම් ලාභයන් හැර) පහත දක්වා ඇති බදු අනුප්‍රමාණයන් අදාළ කර ගනිමින් ගණනය කළ යුතුය.

| බදු අයවන ආදායම | බදු අනුප්‍රමාණය |
|---|---|
| පළමු රු.1,000 000/- | 0 |
| ඉතිරිය | 6% |

**4. බද්ද ගෙවීම**

හවුල් ව්‍යාපාර විසින් 2023/2024 තක්සේරු වර්ෂය සඳහා ලබා දුන් ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශයේ සඳහන් ගෙවිය යුතු බද්ද පහත දැක්වෙන දිනවල දී, අදාළ ගෙවීම් කේතයන් භාවිතා කරමින් වාරික මගින් ගෙවීම් සිදු කර තිබිය යුතුය.

| බදු වාරිකය | ගෙවීම නියමිත දිනය | ගෙවීම් කාල සීමා කේතය |
|---|---|---|
| පළමු වාරිකය | 2023 අගෝස්තු 15 | 23241 |
| දෙවන වාරිකය | 2023 නොවැම්බර් 15 | 23242 |
| තෙවන වාරිකය | 2024 පෙබරවාරි 15 | 23243 |
| හතරවන වාරිකය | 2024 මැයි 15 | 23244 |
| අවසන් වාරිකය | 2024 සැප්තැම්බර් 30 | 23240 |

වාරික ගෙවීම් හතර, අවසාන ගෙවීම සහ අදාළ වන බදු බැරවල එකතුව 2023/2024 තක්සේරු වර්ෂයේ මුළු බදු බැදියාවට සමාන විය යුතුය.

**5.** හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු හෝ හවුල්කරුවෙකු විසින් 2023/2024 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව සහ උපලේඛන ගොනු කිරීම අවශ්‍ය වේ.

**6. දණ්ඩන විධිවිධාන**

- **වාර්තාව ප්‍රමාද වී ගොනු කිරීම සහ භාර නොදීම සහ වැරදි හෝ නොමග යවන සුළු වාර්තා සඳහා අදාළ වන දණ්ඩන විධිවිධාන**

- ප්‍රමාද වී ආදායම් වාර්තාවක් ගොනු කිරීම

i. ගෙවීමට ඇති බදු මුදලින් 5% ක් සමග, ගොනු කිරීමට අපොහොසත් වීම අඛණ්ඩව පවත්නා එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා ගෙවීමට ඇති බදු මුදල් ප්‍රමාණයෙන් 1% ක් ද සහ

ii. රු.50,000/= ක් සහ නියමිත දිනට හෝ ඊට පෙර එනම් 2024 නොවැම්බර් 30 ට පෙර ගොනු කිරීමට අපොහොසත් වීම අඛණ්ඩව පවත්නා එක් එක් මාසය හෝ මාසයක කොටසක් සඳහා වැඩිදුර රුපියල් දස දහසක්, යන්නෙන්, වඩා වැඩි මුදලට සමාන දඩයකට යටත් විය යුතුය.

- අසත්‍ය හෝ නොමඟ යවන සුළු ප්‍රකාශයක් සැපයීම මත දණ්ඩනය, එකී ප්‍රකාශය පදනම් කරගෙන බදු බැදියාව නිශ්චය කළේ නම් ගෙවිය යුතු බදු අඩුවන ප්‍රමාණය හෝ ආපසු ගෙවිය යුතු මුදල වැඩිවන ප්‍රමාණය, යන මුදල් ප්‍රමාණවලින් රු.50,000/= ට වැඩි මුදල් ප්‍රමාණය වන්නේය.

- වාර්තාවක් ගොනු කිරීමට අපොහොසත් වන තැනැත්තකු රුපියල් මිලියනයක් නොඉක්මවනු ලබන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවනු ලබන කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමකට හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

- **වාරික ගෙවීම් නියමිත දිනට ගෙවීමට අපොහොසත් විම මත දණ්ඩන විධිවිධාන**

(i) යම් බදු කාල පරිච්ඡේදයක් සඳහා ගෙවිය යුතු බදු මුදල හෝ ඉන් කොටසක්, තක්සේරු දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති දිනට ගෙවිමට අපොහොසත් වන තැනැත්තෙකු ගෙවිය යුතු එහෙත් ගෙවා නොමැති බදු මුදල් ප්‍රමාණයෙන් 20% සමාන දණ්ඩනයකට යටත් වේ.

(ii) දේශීය ආදායම් පනත යටතේ නියම කරන ලද වාරිකයේ සමස්තය හෝ කොටසක් ගෙවීමට අපොහොසත් වන තැනැත්තෙකු ගෙවිය යුතු එහෙත් ගෙවා නොමැති බදු මුදල් ප්‍රමාණයෙන් 10% සමාන දණ්ඩනයකට යටත් වේ.

- නියමිත දිනයට අදාළ බදු ප්‍රමාණය ගෙවා නොමැති නම්, 151 වගන්තියට යටත්ව (ගෙවීම සඳහා කාලය දිර්ඝ කිරීම) බදු ගෙවන්නා, නියමිත දිනයේ සිට බදු ගෙවන දිනය දක්වා වු කාල පරිච්ඡේදය සඳහා එම ප්‍රමාණය මත, මාසයකට හෝ මසකින් කොටසක් සඳහා 1.5% ක පොලියක් ගෙවිය යුතු වේ.

## ආ. හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව සහ ඒ හා සම්බන්ධ උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්.

ඔබට සපයා ඇති ආකෘති කට්ටලය කොටස් දෙකකින් සමන්විත වේ;

1. **ආදායම් වාර්තාව**
2. **ආදායම් වාර්තාව සඳහා වන උපලේඛන**

### I. ආදායම් වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස්.

- ආදායම් වාර්තාව කොටස් දෙකකින් සමන්විතය.

  1 කොටස - ආදායම සහ බදු ආගණනය
  2 කොටස - ප්‍රකාශය

**1 කොටස - ආදායම සහ බදු ආගණනය**

- මෙය කොටස් හතරකින් සමන්විතය.

  අ කොටස - බදු බැඳියාවට යටත් ආදායම
  ආ කොටස - තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම්
  ඇ කොටස - ගෙවිය යුතු බද්ද ගණනය කිරීම
  ඈ කොටස - නිදහස් කළ ප්‍රමාණ/ලැබීම් සහ ලාභ

**2 කොටස - ප්‍රකාශය**

- අනුමත ගණකාධිකාරීවරයෙකු ඇතුළු වෙනත් යම් තැනැත්තකු විසින් ගෙවීමක් සඳහා ආදායම් වාර්තාව හෝ ආදායම් වාර්තාවක කොටසක් සකස් කර ඇති අවස්ථාවක දී පිළිතුර "ඔව්" ලෙස ද එසේ නොමැති නම් පිළිතුර "නැත" ලෙස ද සලකුණු කරන්න. පිළිතුර "ඔව්" ලෙස සලකුණු කළේ නම්, **ප්‍රකාශයේ "අ කොටස"** සම්පූර්ණ කර එම තැනැත්තා විසින් නිකුත් කරන ලද සහතිකය/සහතික අමුණන්න. මේ සඳහා එක් පුද්ගලයෙකුට වඩා වැඩි පුද්ගලයන් සංඛ්‍යාවක් සම්බන්ධ වූ අවස්ථාවක ඉහත තොරතුරු වෙනම ලේඛනයක සම්පූර්ණ කර වාර්තාවට අමුණන්න.

- දේශීය ආදායම් පනතේ 126 (4) වගන්තිය ප්‍රකාරව, බදු ගෙවන්නා හෝ බදු ගෙවන්නාගේ නිසි බලයලත් නියෝජිතයා ආදායම් වාර්තාව, එහි නිරවද්‍යභාවය හා සම්පූර්ණත්වය තහවුරු කරමින් අත්සන් කිරීම කළ යුතුවේ.

  එබැවින්, බදු ගෙවන්නා හෝ ඔහුගේ නිසි බලයලත් නියෝජිතවරයා **ප්‍රකාශයේ ආ කොටසෙහි** ඔහුගේ /ඇයගේ නම සහ දිනය සඳහන් කරමින් අත්සන් කිරීම අවශ්‍ය ය.

- ඔබ ආදායම් වාර්තාව ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කරන විට, උපලේඛනවල දක්වා ඇති කොටුවලට අදාල අගයන් නිවැරදිව ඇතුළත් කරන්නේ නම්, වාර්තාවේ දැක්වෙන කොටුවලට අදාල අගයන් තමන් විසින් ගණනය කර පිරවීමට අවශ්‍ය නොවේ. එම කොටුවල සඳහනන් විය යුතු අගයන් නිවැරදිව ගණනය වී ස්වයංක්‍රීයව එම කොටුවල පිර වේ.

**II ආදායම් වාර්තාව - උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

- ආදායම් වාර්තාව සමග පහත සඳහන් උපලේඛන සපයා ඇත.

| උපලේඛන අංකය | උපලේඛනයේ නම |
|---|---|
| උපලේඛනය 1 | හවුල්කරුවන් සහ ලාභ කොටස් පිළිබඳ විස්තර |
| උපලේඛනය 2(අ) | හවුල් ව්‍යාපාර ආදායම සහ ප්‍රාග්ධන ලාභ බෙදාහැරීම |
| උපලේඛනය 2(ආ) | හවුල් ව්‍යාපාරයේ නිදහස් ආදායම් බෙදාහැරීම |
| උපලේඛනය 3(අ) | ප්‍රාග්ධන ලාභ බද්ද ගෙවීම පිළිබඳ විස්තර |
| උපලේඛනය 3(ආ) | අනුයෝජිතයා විසින් අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බදු පිළිබඳ විස්තර |
| උපලේඛනය 3(ඇ) | ස්ව තක්සේරු බදු ගෙවීම් (ප්‍රාග්ධන ලාභ බද්ද හැර) |
| උපලේඛනය 4(අ) | ගෙවිය යුතු බද්ද ගණනය කිරීම |
| උපලේඛනය 4(ආ) | බදු බැර |
| උපලේඛනය 5(අ) | ස්ව තක්සේරු ගෙවීම් සහ ප්‍රාග්ධන ලාභ බද්ද බෙදාහැරීම |
| උපලේඛනය 5(ආ) | සුදුසුකම් ලබන ගෙවීම් සහ අත්තිකාරම් ආදායම් බද්ද බෙදාහැරීම |
| උපලේඛනය 6 | හවුල් ව්‍යාපාර අලාභ ගැලපුම් පිළිබඳ විස්තර |
| උපලේඛනය 7 | හවුල් ව්‍යාපාරය පිළිබඳ විස්තර |

**හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව සඳහා වන උපලේඛන**

**1. 1 වන උපලේඛනය - හවුල්කරුවන් පිළිබඳ විස්තර**

හවුල්කරුවාගේ නම, බදුගෙවන්නා හඳුනාගැනීමේ අංකය (බ.ගෙ.හ.අංකය), ජාතික හැඳුනුම්පත් අංකය (ජා.හැ.අ.) සහ හවුල් ව්‍යාපාරය මගින් හවුල්කරුවන් වෙත ලාභ/අලාභ බෙදාහැරීමේ අනුපාතය පිළිබඳ තොරතුරු ඇතුළත් කර 1 වන උපලේඛනය සම්පූර්ණ කරන්න.

## 2. 2(අ) සහ 2(ආ) උපලේඛන: හවුල් ව්‍යාපාර ආදායම, ප්‍රාග්ධන ලාභ සහ නිදහස් ලැබීම් බෙදාහැරීම.

ඒ සඳහා 1 වන උපලේඛනයේ අනුපිළිවෙළ පරිදි, එක් එක් හවුල්කරුවන් සඳහා වෙනම පේළියක් භාවිතා කරන්න.

### 2.1 2(අ) උපලේඛනය: හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර ආදායම බෙදාහැරීම

**205 තීරුව:** හවුල් ව්‍යාපාරයක් විසින් හවුල්කරුවෙකුට හෝ ඔහුගේ/ඇයගේ කලත්‍රයාට ගෙවූ **වැටුප්, පඩිනඩි හෝ** (යම් සේවාවක් වෙනුවෙන්) **ගාස්තු** පිළිබඳ විස්තර මෙහි ඇතුළත් කරන්න.

**206 තීරුව:** හවුල් ව්‍යාපාරයක් විසින් හවුල්කරුවන්ට, **ණය හෝ ප්‍රාග්ධනය මත යම් පොලියක්** ගෙවනු ලබයි නම්, එම විස්තර ඇතුළත් කරන්න.

**207 තීරුව:** හවුල් ව්‍යාපාරයක ලාභ බෙදා දීමේ අනුපාතය මත පදනම්ව හවුල් ව්‍යාපාරයක් විසින් සෑම හවුල්කරුවෙකුටම වෙන් කරන ලද **ඉතිරි ව්‍යාපාර ආදායම** හෝ **ව්‍යාපාර අලාභය** ඇතුළත් කරන්න.

**208 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් එක් එක් හවුල් කරුවන්ට ගෙවන ලද වැටුප්, පඩිනඩි, සේවා ගාස්තු, ණය/ප්‍රාග්ධනය මත ගෙවනු ලැබූ යම් පොලියක් සහ ඉතිරි ව්‍යාපාර ආදායමෙහි එකතුව 208 තීරුවට වෙන් වෙන්ව ඇතුළත් කරන්න.

උදාහරණ:
කොටු 205.1+206.1+207.1 හි එකතුව 208.1 කොටුවට
කොටු 205.2+206.2+207.2 හි එකතුව 208.2 කොටුවට

එමගින් 208.5 කොටුවට ලබා ගන්නා අගය (208.1 + 208.2 + 208.3 + 208.4 කොටු වල එකතුව) ව්‍යාපාර ලාභයක් නිරූපණය කරන්නේ නම් පමණක් වාර්තාවේ 10 වන කොටුවට එය ඇතුළත් කරන්න.

208.5 කොටුවෙහි එකතුව ව්‍යාපාර අලාභයක් නිරූපණය කරන විටක එම අලාභය ඍණ අගයක් ලෙස 208.5 කොටුවට ඇතුළත් කරන්න. වාර්තාවේ 10 වන කොටුව "0" ලෙස දක්වන්න.
ව්‍යාපාර අලාභය 6 වන උපලේඛනයේ 243.2 කොටුවට ඇතුළත් කරන්න.

## 2.2 හවුල් ව්‍යාපාරයේ ආයෝජන ආදායම, වෙනත් ආදායම් සහ ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් වන ලැබීම් බෙදාහැරීම.

**209 තීරුව:** එක් එක් හවුල්කරුවන්ගේ ආයෝජන ආදායමේ/අලාභයේ අදාළ කොටස පිළිවෙලින් 209.1, 209.2, 209.3 හා 209.4 කොටුවලට ඇතුළත් කරන්න. ඒවායේ එකතුව 209.5 කොටුවට ලබා ගන්න. 209.5 කොටුවෙහි අගය ආයෝජන ලාභයක් නිරූපණය කරන්නේ නම් හා ආයෝජන ලාභයට එරෙහිව හිලවු කරගත හැකි ව්‍යාපාර අලාභයක් 2023/2024 තක්සේරු වර්ෂය තුළ නොපවතින්නේ නම් පමණක් එම අගය වාර්තාවේ 20 කොටුවට ඇතුළත් කරන්න.

ආයෝජන ආදායමට එරෙහිව හිලවු කර ගත හැකි ව්‍යාපාර අලාභයක් පවතින්නේ නම් එසේ හිලවු කරගත හැකි ව්‍යාපාර අලාභයේ ප්‍රමාණය උපලේඛන 6හි 243.4 කොටුවට ඇතුළත් කරන්න. අලාභය හිලවු කර ගැනීමෙන් පසු ඉතිරි ආයෝජන ආදායම වාර්තාවේ 20 කොටුවට ඇතුළත් කරන්න.

209.5 කොටුවේ එකතුව ආයෝජන අලාභයක් නිරූපණය කරන විටක එය ඍණ අගයක් ලෙස දක්වන්න. එම අලාභයේ ප්‍රමාණය උපලේඛන 6හි 244.2 කොටුවට ඇතුළත් කරන්න.
වාර්තාවේ 20 වන කොටුව "0" ලෙස දක්වන්න.

**210 තීරුව:** එක් එක් හවුල්කරුවන්ගේ වෙනත් ආදායමේ අදාළ කොටස 210 තීරුවේ ඇතුළත් කරන්න. 210.5 කොටුවෙහි ඇති වෙනත් ආදායම්වල එකතුව වාර්තාවේ 30 වන කොටුවට ඇතුළත් කරන්න.

**211 තීරුව:** හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර ආදායම, ආයෝජන ආදායම සහ වෙනත් ආදායම්වල එකතුව **211 තීරුවේ** එක් එක් හවුල්කරුට වෙන වෙනම ඇතුළත් කරන්න.

උදාහරණ:
208.1+209.1+210.1 හි එකතුව 211.1 ඇතුළත් කරන්න.
208.2+209.2+210.2 හි එකතුව 211.2 ඇතුළත් කරන්න.

**212 තීරුව:** එක් එක් හවුල්කරුගේ ආයෝජන වත්කම් උපලබ්ධිවීමෙන් ලැබූ ලාභ/අලාභ, කොටස 212 තීරුවට ඇතුළත් කරන්න. 212.5 කොටුවේ එකතුව ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් ලැබූ ලාභයක් නිරූපණය කරන විටක පමණක් එම අගය වාර්තාවේ 40 වන කොටුවට ඇතුළත් කරන්න.

212.5 කොටුවේ ඇති අගය ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් උද්ගත වූ අලාභයක් නිරූපණය කරන විටක එම අගය ඍණ අගයක් ලෙස දක්වන්න. වාර්තාවේ 40 වන කොටුව "0" ලෙස දක්වන්න.

### 2.3 2(ආ) උපලේඛනය: හවුල් ව්‍යාපාරයේ නිදහස් ප්‍රමාණ/ලැබීම් බෙදාහැරීම.

**213 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් උපයන ලද නිදහස් ආදායම් ප්‍රමාණ/ලැබීම්/ අලාභ (මුළු තක්සේරු වර්ෂයටම අදාළ) එක් එක් හවුල්කරුවන්ට වෙන් වෙන්ව 213 තීරුවට ඇතුළත් කරන්න. ඒවායේ එකතුව 213.5 කොටුවට ගන්න. 213.5 කොටුවේ එකතුව බදු නිදහස් ආදායමක් නිරූපණය කරන විටක හා එම ආදායමෙන් හිලවු කරගත හැකි ව්‍යාපාර අලාභයක් නොමැති විටක පමණක් 213.5 කොටුවෙහි අගය වාර්තාවේ 130 කොටුවට ඇතුළත් කරන්න.

බදු නිදහස් ආදායමට එරෙහිව හිලවු කරගත හැකි ව්‍යාපාර අලාභයක් 2022/2023 තක්සේරු වර්ෂය තුළ පවතී නම්, ව්‍යාපාර අලාභයේ හිලවු කර ගත හැකි ප්‍රමාණය 6 වන උපලේඛනයේ 243.6 කොටුවට ඇතුළත් කරන්න. අලාභය හිලවු කර ගැනීමෙන් පසු ඉතිරි බදු නිදහස් ආදායම වාර්තාවේ 130 කොටුවට ඇතුළත් කරන්න.

213.5 කොටුවෙහි අගය අලාභයක් නිරූපණය කරන විටක එය ඍණ අගයක් ලෙස කොටුව තුළ දක්වන්න. අලාභය 245.2 කොටුවට ඇතුළත් කරන්න.

**213A තීරුව:** 213 කොටුවේ ප්‍රකාශ කරන ලද නිදහස් ආදායම් පිළිබඳ විස්තර 213A තීරුවේ ඇතුළත් කරන්න.

## 3. 3 වන උපලේඛනය - හවුල් ව්‍යාපාර ආදායම මත ගෙවන ලද බද්ද

මෙම උපලේඛනය 3(අ), 3(ආ) සහ 3(ඇ) ලෙස අනු උපලේඛන තුනකින් සමන්විතය.

### 3.1 3(අ) උපලේඛනය: ප්‍රාග්ධන ලාභ බද්ද ගෙවීම පිළිබඳ විස්තර

**214 තීරුව:** ආයෝජන වත්කම් උපලබ්ධි වූ දිනය 214 තීරුවේ ඇතුළත් කරන්න.

**215 සහ 216 තීරු:** 2023/2024 තක්සේරු වර්ෂය සඳහා ආයෝජන වත්කම් උපලබ්ධිවීම මත වන ලැබීම් මත 10% ක අනුප්‍රමාණයෙන් හවුල් ව්‍යාපාරය විසින් ප්‍රාග්ධන ලාභ මත බද්ද ගෙවූ දිනය සහ එම ප්‍රමාණ පිළිබඳ විස්තර පිළිවෙලින් 215 සහ 216 තීරුවල ඇතුළත් කරන්න. 216.5 කොටුවෙහි එකතුව 4ආ උපලේඛනයේ 235 කොටුවට ඇතුළත් කරන්න.

## 3.2 3(ආ) උපලේඛනය: අනුයෝජිතයා විසින් අඩු කළ අත්තිකාරම් ආදායම් බදු පිළිබඳ විස්තර.

අනුයෝජිතයා විසින් අඩු කර ගෙවන ලද අත්තිකාරම් ආදායම් බදු ගෙවීම් 217 සිට 222 දක්වා තීරුවල එක් එක් පේළියේ ඇතුළත් කරන්න. අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බදුවල එකතුව 222.5 කොටුවේ ඇතුළත් කරන්න.

225.5 කොටුවේ එකතුව 4 ආ උපලේඛනයේ 236 කොටුවට ඇතුළත් කරන්න.

## 3.3 3(ඇ) උපලේඛනය: ස්ව තක්සේරු බදු ගෙවීම් (ප්‍රාග්ධන ලාභ බද්ද හැර)

ස්ව තක්සේරු ගෙවීම් සහ අවසාන ගෙවීමේ දින සහ ගෙවූ ප්‍රමාණයන් 3 (ඇ) උපලේඛනයේ දී ඇති පේළිවල ඇතුළත් කරන්න

228.2 කොටුවෙහි එකතුව 4 ආ උපලේඛනයේ 237 කොටුවට ඇතුළත් කරන්න.

## 4. 4 වන උපලේඛනය: බදු අයකළ හැකි ආදායම, ගෙවිය යුතු බද්ද ගණනය කිරීම සහ බදු බැර

### 4.1 4 (අ) උපලේඛනය: බදු අය කළ හැකි ආදායම සහ ගෙවිය යුතු බද්ද ගණනය කිරීම

**- හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායම**

හවුල් ව්‍යාපාරයක් විසින් එහි බදු අය කළ හැකි ආදායම මත (ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් වන ලැබීම් හැර) 6% අනුප්‍රමාණයට (රු.1,000,000.00 ක සහනයට යටත්ව) හා ව්‍යාපාරයේ ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් උද්ගත වූ ලාභ මත 10% අනුප්‍රමාණයට ආදායම් බද්ද ගෙවිය යුතු වේ.

හවුල් ව්‍යාපාරයේ (ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් වන ලැබීම් හැර) බදු අයකළ හැකි ආදායම 4A උපලේඛනයේ 229 කොටුවට ඇතුළත් කරන්න. ආයෝජන වත්කම් උපලබ්ධි වීමෙන් වන ලැබීම් මත බදු අය කළ හැකි ආදායම 233.1 කොටුවට ඇතුළත් කරන්න.

2023/2024 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය සඳහා සුදුසුකම් ලබන ගෙවීම් කිසිවක් නොපවතින විටක;

වාර්තාවේ කොටු (10+20+30) = 4A උපලේඛනයේ 229 කොටුව
වාර්තාවේ 40 කොටුව = 4A උපලේඛනයේ 233.1 කොටුව

2023/2024 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය විසින් සුදුසුකම් ලබන ගෙවීම් පවතින විටක, වාර්තාවේ 60 වන කොටුවට ඇතුළත් කරන ලද සුදුසුකම් ලබන ගෙවීම් අඩු කිරීමෙන් පසු ලැබෙන ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන බදු අය කළ හැකි ආදායම 233.1 කොටුවටත් ඉතිරි බදු අය කළ හැකි ආදායම 229 කොටුවටත් ඇතුළත් කරන්න.

229 කොටුවට ඇතුළත් කරන ලද බදු අය කළ හැකි ආදායමෙන් පළමු රුපියල් මිලියනය (රු.1,000,000.00) සඳහා අදාළ වන බදු අනුප්‍රමාණය 0% වේ. ඉතිරි බදු අය කළ හැකි ආදායම 4A උපලේඛනයේ 231.1 කොටුවටත් ඒ මත 6% අනුප්‍රමාණයෙන් ගණනය කරන ලද බද්ද 231.3 කොටුවටත් ඇතුළත් කරන්න.
230.3 හා 231.3 කොටුවල එකතුව 232.3 කොටුවට ලබාගන්න.

**- ආයෝජන වත්කම් උපලබ්ධිවීම මත ලබන ලැබීම් මත බද්ද**

ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන මුළු ලැබීම් (233.1 වන කොටුවේ ඇතුළත් කර ඇති ආදායම) මත 10% ක බදු අනුප්‍රමාණයක් අදාළ කර ගනිමින් ගණනය කරන ලද බද්ද 233.3 කොටුවට ඇතුළත් කරන්න. එම අගය ප්‍රධාන වාර්තාවේ 90 වන කොටුවට ඇතුළත් කළ යුතුය

**4.2 4 (ආ) උපලේඛනය: බදු බැර**

කොටු අංක 234 සිට 237 දක්වා ඇති කොටුවලට අදාළ බදු බැර ඇතුළත් කළ හැක.

- **විදේශ බදු බැර (234 කොටුව)**

යම් විදේශ බදු සහනයකට ඔබට හිමිකම ඇත්තේ නම් එවැනි ප්‍රමාණ 4(ආ) උපලේඛනයේ 234 වන කොටුවට ඇතුළත් කරන්න. විදේශ බදු බැර සඳහා අඩු කිරීම් ලබා ගැනීමේ දී පනතේ 80 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූල විය යුතුය.

- **ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන ලැබීම් මත ගෙවූ බද්ද (235 කොටුව)**

ආයෝජන වත්කම් උපලබ්ධි වීම මගින් වන ලැබීම් මත, 2023/2024 තක්සේරු වර්ෂය සඳහා ගෙවූ මුළු බද්ද 235 වන කොටුවේ ඇතුළත් කරන්න. (3 ආ උපලේඛනයේ 216.5 කොටුවේ අගය)

- **අත්තිකාරම් ආදායම් බදු (236 කොටුව)**

අනුයෝජිතයා විසින් අඩු කරන ලද මුළු අත්තිකාරම් ආදායම් බද්ද 236 කොටුවේ ඇතුළත් කරන්න.

- **ස්ව තක්සේරු මත ගෙවීම් (237 කොටුව)**

3(ඈ) උපලේඛනයේ 228.2 කොටුවෙහි එකතුව 4 (ආ) උපලේඛනයේ 237 කොටුවට ඇතුළත් කරන්න.

**238 වන කොටුවේ ඇති මුළු බදු බැරවල එකතුව වාර්තාවේ 110 වන කොටුවට ඇතුළත් කරන්න.**

## 5. හවුල්කරුවන් වෙත බදු ගෙවීම්, සුදුසුකම් ලබන ගෙවීම් සහ අත්තිකාරම් ආදායම් බද්ද බෙදා හැරීම

### 5.1 5(අ) උපලේඛනය: හවුල් ව්‍යාපාර ආදායම මත ගෙවූ ස්ව තක්සේරු ගෙවීම් සහ ප්‍රාග්ධන ලාභ බද්ද බෙදා හැරීම

**239 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් ගෙවන ලද ස්ව තක්සේරු ගෙවීම්වල සහ අවසාන ගෙවීමේ එකතුව එක් එක් හවුල්කරුවන් සඳහා බෙදා වෙන්කර ඇතුළත් කරන්න. මෙහි 239 තීරුවේ එකතුව 3 (ඈ) උපලේඛනයේ 228.2 කොටුවෙහි එකතුවට සමාන විය යුතුය.

**240 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් ගෙවනු ලැබූ ප්‍රාග්ධන ලාභ බද්ද එක් එක් හවුල් කරුවන් වෙත බෙදා වෙන්කර දැක්වීමට මෙම තීරුව භාවිතා කරන්න. මෙහි 240 තීරුවේ එකතුව 3 (අ) උපලේඛනයේ 216.5 කොටුවට සමාන විය යුතුය

හවුල් ව්‍යාපාරයක් විසින් හවුල් ව්‍යාපාර ආදායම මත ගෙවන ලද වාරික ගෙවීම්, හවුල් කරුවන් අතර බෙදා වෙන් කළ යුතුය. එහෙත් එසේ බෙදා වෙන් කරන ලද වාරික මුදලක් මඟින් පැන නඟින අතිරික්ත බද්දක් සඳහා ආපසු ගෙවීමක් ඉල්ලා සිටීමට හවුල්කරුවන්ට හිමිකමක් නොපවතින නමුත් එය පසුව එළඹෙන තක්සේරු වර්ෂයේ බදු බැරක් ලෙස ඉදිරියට ගෙන යාමේ හිමිකම පවතී.

### 5.2 5(ආ) උපලේඛනය: සුදුසුකම් ලබන ගෙවීම් හා අත්තිකාරම් ආදායම් බද්ද

**241 තීරුව:** හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද සමුච්චිත සුදුසුකම් ලබන ගෙවීම් හවුල් කරුවන් වෙත බෙදා වෙන් කරන්න.

හවුල් ව්‍යාපාරය විසින් 2023/2024 තක්සේරු වර්ෂය සඳහා සිදු කරන ලද සම්මුචිත සුදුසුකම් ලබන ගෙවීම් තුළ පුණ්‍යායතනයකට මුදලින් කරන ලද පරිත්‍යාගයක් ඇතුළත් වන්නේ නම්, (පනතේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කිරීමට යටත්ව) එසේ පරිත්‍යාග කරන ලද මුදලින් රු.500,000/- හෝ හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායමෙන් 1/5 ක් යන්නෙන් අඩු අගයෙහි සීමාවට යටත්ව අඩු කිරීමට හිමිකම ලැබේ.

ඒ අනුව ඉහත ගැළපීම් සිදු කිරීමෙන් පසු හවුල් ව්‍යාපාරය විසින් අඩු කිරීමට හිමිකම් ලබන සුදුසුකම් ලත් ගෙවීම් ප්‍රමාණය වාර්තාවේ 60 වන කොටුවට ඇතුළත් කරන්න.

**242 තීරුව:** හවුල් ව්‍යාපාර ආදායම මත අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බද්ද හවුල් කරුවන් අතර බෙදා දැක්වීමට මෙම තීරුව යොදා ගන්න. 242 තීරුවේ එකතුව 3 ආ උපලේඛනයේ 222.5 කොටුවේ අගයට සමාන විය යුතුය.

## 6. 6 වන උපලේඛනය: හවුල් ව්‍යාපාර අලාභ ගැලපීම පිළිබඳ විස්තර

2023/2024 තක්සේරු වර්ෂයේ ව්‍යාපාර අලාභ, ආයෝජන අලාභ සහ නිදහස් අලාභ පිළිවෙලින් 243.2, 244.2 සහ 245.2 කොටුවල ඇතුළත් කරන්න. එම තක්සේරු වර්ෂයට අදාල අඩු කළ හැකි අලාභ 3, 4 සහ 6 යන තීරුවල ඇතුළත් කරන්න.

මුළු අඩු කිරීම් 07 වන තීරුවට ගන්න.

එක් එක් ආදායමට එරෙහිව හිලවු කරගත හැකි අලාභ ප්‍රමාණ අදාළ පරිදි 6 වන උපලේඛනයේ 3, 4,,6 යන තීරු වලත්, හිලවු කර ගත හැකි මුළු අලාභ ප්‍රමාණය 7 වන තීරුවටත් ඇතුළත් කරන්න.

## 7. 7 වන උපලේඛනය: හවුල් ව්‍යාපාරයේ විස්තර

හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ ගිණුමේ විස්තර 246 සිට 253 දක්වා කොටුවල සහ ශේෂ පත්‍රයේ විස්තර 254 සිට 260 දක්වා කොටුවල ඇතුළත් කරන්න.

බදු - වඩා හොඳ අනාගතයකට
வரிகள் – வளமான எதிர்காலத்திற்காக
TAXES - FOR A BETTER FUTURE